# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

## ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ**
**පනත් කෙටුම්පතකි**

රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වෛද්‍ය ජනක සේනාරත්න මහතා විසින්
2026 ජුනි මස 25 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2026 ජුනි මස 11 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

[67 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 58.00 තැපැල් ගාස්තුව: රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ)

## ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

**පූර්විකාව**

''ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය'' යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයින් එකඟ වී ඇති රීතිවලට අනුකූලව, එහි පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ එකී සංගමය හා සම්බන්ධ සියලු කාරණා ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින්ද:

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ යම් කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් ද, එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, එකී ඉල්ලීම ඉටුකිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**ලුහුඬු නාමය**

**1.** මේ පනත 2026 අංක   දරන ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය සංස්ථාගත කිරීම**

**2.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසුව (මෙහි මින්මතු ''සංගමය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් මින්මතු ඇතුළත් කරගනු ලබන සියලු තැනැත්තන් (මෙහි මින් මතු ''සංස්ථාපිත මණ්ඩලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය යන නාමය සහ අභිධානය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංස්ථාපිත මණ්ඩලය විසින් ද, එයට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි ය. තවද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේද, පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

PL 15818 - 117 (2026/06)

(2) සංස්ථාපිත මණ්ඩලය, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

**3.** (1) වෙනත් යම් ලිඛිත නීතියක හෝ මේ පනතේ 7 වන වගන්තිය යටතේ සාදන ලද රීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලය සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:-

(අ) ශ්‍රී ලංකාවේ ඖෂධවේදය සහ එහි භාවිතයන් නගා සිටුවීම;

(ආ) ඖෂධවේදය පිළිබඳ දැනුම ලබා ගැනීම, ප්‍රචලිත කිරීම සහ අන්තර් හුවමාරු ප්‍රවර්ධනය කිරීම;

(ඇ) සියලුම මට්ටම්වලින් ඖෂධවේදය පිළිබඳ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම;

(ඈ) ඖෂධවේදයේ මූලික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ උනන්දු කරවීම;

(ඉ) සංස්ථාවේ සාමාජිකයන්ගේ වෘත්තීය කටයුතුවල සහ සාමාන්‍ය හැසිරීම්වල ඉහළ ප්‍රමිතීන් පවත්වාගෙන යාම සහතික කිරීම; සහ

(ඊ) ශ්‍රී ලංකාව තුළ ඖෂධවේදී වෘත්තීයේ තත්ත්වය වැඩි දියුණු කිරීම.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී, එම පරමාර්ථ වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය, උපන් ස්ථානය හෝ ඉන් කවර හෝ හේතුවක් මත වෙනස්කමකට භාජනය නොවන පරිදි ක්‍රියාත්මක කිරීමට සංස්ථාපිත මණ්ඩලය වගබලා ගත යුතු ය.

රජයේ හෝ පළාත් සභාවක, අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක හෝ පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක හෝ රාජ්‍ය සංස්ථාවක කාර්ය සහ සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය අතර ගැටුමක් ඇති නොවන බවට සංස්ථාපිත මණ්ඩලය වගබලා ගත යුතු බව

**4.** සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ, අදාළ යම් ලිඛිත නීතියකට යටත්ව සහ රජයේ හෝ යම් පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් හෝ පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින්, සමගාමීව පවත්වා ගෙන යනු ලබන යම් කාර්යයක් සහ සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය අතර කිසිදු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයෙන් සහ ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමණාකරණය කිරීම

**5.** (1) වෙනත් යම් ලිඛිත නීතියක, මේ පනතේ හෝ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලන කිරීම, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ධුර දරන්නන් යම් සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින් මතු සභාව වශයෙන් සඳහන් කරනු ලබන) විධායක සභාවක් විසින්, එම රීතිවල නිශ්චිතව දක්වනු ලැබිය හැකි වූ ආකාරයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී, ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමයේ සභාවේ ධුර දරන සාමාජිකයින් විසින් (ආ) ඡේදය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් දක්වා ඇති ආකාරයට, (ඇ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ දී සංස්ථාපිත මණ්ඩලයේ පළමු සභාව පත් කරනු ලබන හෝ තෝරා පත් කරගනු ලබන තෙක්, සංස්ථාපිත මණ්ඩලයේ අතුරු සභාව වශයෙන් කටයුතු කළ යුතු ය.

(ආ) 7 වන වගන්තියේ (2) වන (3) වන, (4) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, මේ පනතේ හෝ වෙනත්

යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන ලෙස සංස්ථාපිත මණ්ඩලයේ අතුරු පරිපාලනය සඳහා රීති සෑදීමට සංස්ථාපිත මණ්ඩලයේ අතුරු සභාවට බලය ඇත්තේ ය.

(ඇ) අතුරු සභාවේ යම් තීරණයක්, එම රැස්වීම සඳහා පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් ගනු ලැබිය යුතු ය.

(ඇ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට වසරක කාලයක් ඇතුළත සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රථම සභාව පත් කරනු ලැබීම හෝ තෝරා පත් කරනු ලැබීම කළ යුතු ය.

(3) (අ) අනුශාසකවරුන් සහ උපදේශකවරුන් ද ඇතුළුව සභාවේ සෑම ධුර දරන්නකුම වසර තුනක කාලයක් සඳහා පත්කර ගත යුතු හෝ තෝරා පත්කර ගත යුතු අතර, එම වසර තුනක කාලසීමාව ඉකුත් වීමෙන් පසුව එකී ධුර දරන්නා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත පත් කර ගැනීම හෝ තෝරා පත් කර ගැනීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(ආ) යම් ධුර දරන්නකු මිය යාම, ඉල්ලා අස්වීම, යම් අශක්නුතාවයකට පත් වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක දී, සභාව විසින්, සංස්ථාපිත මණ්ඩලයේ රීති සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා පත් කර ගැනීම හෝ පත් කර ගැනීම කළ යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ තෝරා පත් ගනු ලැබූ හෝ පත් කර ගනු ලැබූ තැනැත්තා, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා පමණක් ධුරය දැරිය යුතු ය.

**6.** වෙනත් යම් ලිඛිත නීතියක, මේ පනතේ සහ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා පහත සඳහන් ක්‍රියා කිරීමට, ඉටුකිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සංස්ථාපිත මණ්ඩලයට බලය තිබිය යුතු ය:- සංස්ථාපිත මණ්ඩලයේ බලතල

(අ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම සහ අන්‍යාකාරයෙන් ලබා ගැනීම සහ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව සභාව විසින් නිශ්චය කරනු ලබන පරිදි ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ එම දේපළ බැහැර කිරීම;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා හෝ එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පරිදි සංස්ථාපිත මණ්ඩලය විසින් සෘජුවම හෝ සංස්ථාපිතමණ්ඩලය විසින් ඒ සම්බන්ධයෙන් බලය පවරන ලද යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් සියලු කොන්ත්‍රාත්තු හෝ ගිවිසුම් වලට ඇතුළත් වීම සහ ක්‍රියාත්මක කිරීම හෝ කරගෙන යාම;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා, ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම හෝ මුදල් රැස් කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍ය වලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, සංස්ථාපිත මණ්ඩලයට ලැබුණු හෝ සංස්ථාපිත මණ්ඩලයට ලබා දෙන ලද ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ඇතුළු විදේශීය අරමුදල් සම්බන්ධයෙන් සභාව විසින් විදේශීය සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගත යුතුය;

(ඈ) (ඇ) ඡේදයේ අතුරු විධානයේ විධිවිධානවලට යටත් ව, විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සකස් කිරීම, ලිවීම, භාර ගැනීම, වට්ටම් කිරීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම,

විකිණීම සහ නිකුත් කිරීම සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල්, සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට ආයෝජනය කිරීම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති යම් නීත්‍යානුකූල භාරයක් හෝ යම් නිශ්චල හෝ පෞද්ගලික දේපළක් භාර ගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පරිපාලනය කිරීම;

(උ) පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති ප්‍රකාරව, සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ සංස්ථාපිත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වැටුප් සහ දීමනා ගෙවීම;

(ඌ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව දේශන, සම්මන්ත්‍රණ සහ සමුළු සංවිධානය කිරීම;

(එ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් දේශීය හා විදේශීය ආයතන සමග සබඳතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම; සහ

(ඒ) මෙම පනත මගින් බලය දී ඇති පරිදි, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා වන දේ කිරීම.

**7.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින්, කලින් කල, සංස්ථාපිත මණ්ඩලයේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය ලබා දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන කරුණු සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධි විධානවලට අනනුකූල නොවන රීති සැදීම නීත්‍යානුකූල වන්නේ ය:-

සංස්ථාපිත මණ්ඩලයේ රීති

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, සාමාජිකත්වය ඉවත් කරගැනීම, සාමාජිකත්වයෙන් නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවනු ලැබිය යුතු ගාස්තු;

(ආ) සභාවේ ධුර දරන්නන් තෝරා පත් කර ගැනීම, හෝ ධුර දරන්නන් ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පත්කිරීමේ නියම සහ කොන්දේසි, ඔවුන්ගේ බලතල, කර්තව්‍ය සහ කාර්ය සහ සේවය අවසන් කිරීම හෝ සේවයෙන් ඉවත් කිරීම, විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ වැටුප් සහ දීමනා ගෙවීම;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ හෝ සභාවෙ රැස්වීම් කැඳවීමේදී සහ පැවැත්වීමේ දී සහ එම රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර නිකුත් කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් වල ගණ පූරණය සහ එහි කටයුතු කරගෙන යාම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ සහ සභාවේ සාමාජිකයෙකු වීම සඳහා වන සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් දේශීය හා විදේශීය ආයතන සමග සබඳතා පවත්වා ගෙන යාමේ, සම්බන්ධීකරණය කිරීමේ සහ ගිවිසුම් ඇති කර ගැනීමේ ආකාරය පාලනය කිරීම සඳහා වන කාර්ය පටිපාටිය; සහ

(ඌ) සාමාන්‍යයෙන් සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ ඉටු කර ගැනීම සහ සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීම.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදනු ලබන යම් රීතියක්, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන්ම එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය සහ මේ පනතේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ සාදනු ලබන රීති, එම රීති සාදනු ලැබීමෙන් පසු මාසයක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එම පළ කරනු ලැබූ දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(4) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදන ලද සෑම රීතියක් ම, එම රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් මාස දෙකක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකළ යම් රීතියක්, ඒ යටතේ නිසි පරිදි කරනු ලැබූ කිසිවකට අගතියක් නොමැතිව, එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ එවැනි යම් රීතියක් පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(6) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සෑම අවස්ථාවකදී ම සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත් විය යුතු ය.

සාමාජික නාමලේඛනය

**8.** සභාව විසින්, සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම, ලිපිනය සහ අනෙකුත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරනු ලැබිය යුතු සාමාජික නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල

**9.** (1) සංස්ථාපිත මණ්ඩලයට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය සඳහා සහ ඒ වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලු මුදල් 6 වන වගන්තියේ (ඇ) ඡේදයේ අතුරු විධානයේ විධිවිධානවලට යටත්ව, සභාව විසින් අනුමත කරනු ලැබූ එක් බැංකුවක හෝ ඊට වැඩි බැංකු සංඛ්‍යාවක සංස්ථාපිත මණ්ඩලයේ නමින් තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාපිත මණ්ඩලය විසින් දරනු ලබන යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය

**10.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භව එළඹෙන වර්ෂයේ මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින්, එහි ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ සංස්ථාපිත මණ්ඩලයේ අනෙකුත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම්, විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර විගණකාධිපතිවරයා විසින් පත් කරන ලද සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු අතර, විගණකාධිපතිවරයා විසින් හෝ එම සුදුසුකම්ලත් විගණකවරයා විසින් සහතික කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා “සුදුසුකම්ලත් විගණකවරයා” යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තකු; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

වාර්ෂික වාර්තාව

**11.** (1) සභාව විසින්, සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක් එක් එක් මුදල් වර්ෂය සඳහා සකස් කරනු ලැබිය යුතු අතර, විගණකාධිපතිවරයා විසින් හෝ විගණකාධිපතිවරයා විසින් පත් කරන ලද 10 වන වගන්තියේ සඳහන් සුදුසුකම්ලත් විගණකවරයා විසින් සහතික කර විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශයක් ද සමඟ සංස්ථාපිත මණ්ඩලයේ සියලු වත්කම් සහ බැරකම් ලැයිස්තුවක් ද, සංස්ථාපිත මණ්ඩලය විසින් ඇතුළත් වන ලද සියලු කොන්ත්‍රාත්තු සහ ගිවිසුම්වල සහ 7 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවල තොරතුරු ද සමග ඒ වාර්තාව සෞඛ්‍යය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත සහ 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත, එම වාර්තාව අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ සය මාසයක් ඉකුත්වීමට පෙර ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති වාර්තාවට, මුදල් වර්ෂය තුළ දී සංස්ථාපිත මණ්ඩලය වෙත විදේශීය සහ දේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙන ම ගිණුම් ප්‍රකාශයක් අමුණනු ලැබිය යුතු ය.

**ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය විසින් ගෙවිය යුතු සහ එම සංගමයට අයවිය යුතු ණය**

12. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේදී ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට සංගමයට ගෙවිය යුතු සියලු ණය සහ ගෙවිය යුතු සියලු සාමාජික සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලයට ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාපිත මණ්ඩලය විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව**

13. වෙනත් යම් ලිඛිත නීතියක, මේ පනතේ සහ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවල විධිවිධානවලට යටත්ව, යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදානයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාපිත මණ්ඩලය සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාපිත මණ්ඩලයට හැකියාව සහ බලය ඇති අතර, එකී දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් එකී සියලු දේපළ දරනු ලැබිය යුතු ය.

**මුදල් සහ දේපළ යෙදවීම**

14. වෙනත් යම් ලිඛිත නීතියක, මේ පනතේ සහ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවල විධිවිධානවලට යටත්ව, කවර ආකාරයකින් හෝ උපචිත වූ සංස්ථාපිත මණ්ඩලයේ මුදල් සහ දේපළ, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටු කර ගැනීම උදෙසා පමණක් යොදා ගත යුතු අතර, ඉන් කිසිදු කොටසක් සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ට ලාභාංශ, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් හෝ අන්‍යාකාරයකින් කවර හෝ ලෙස සෘජුව හෝ වක්‍රව ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය.

**සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව**

15. (1) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, සභාවේ සභාපති හෝ මහ ලේකම් සහ භාණ්ඩාගාරික ඉදිරිපිට දී මිස, කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තෙකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, සභාව විසින් තීරණය කරනු ලබන, සභාවේ ධුර දරන්නකු භාරයේ තැබිය යුතු ය.

*විසුරුවා හැරීමක දී ඉතිරි වන දේපළ*

**16.** (1) සංස්ථාපිත මණ්ඩලය විසිරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වී තිබුණහොත්, එම දේපළ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් අදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලැබ ඇත්තා වූ ද වෙනත් යම් උචිත ආයතනයකට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා උචිත ආයතනය, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමතය ඇති ව, සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමට පෙරාතුවම සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් විසින් එහි මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

*ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම*

**17.** මේ පනතේ සඳහන් කිසිවකින් ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ වෙනත් යම් සංස්ථාවක අයිතිවාසිකම්වලට අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

*අර්ථ නිරූපණය*

**18.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි -

"බැංකුව" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන යටතේ බලපත්‍රලත් බැංකුවක් අදහස් වේ;

"ලිඛිත නීතිය" යන්නට, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එම යෙදුමට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

**19.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුබව